ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියට ප්‍රාදේශීය දේවාල පද්ධතියේ මැදිහත්වීම සම්බන්ධ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර උත්පලවන්නා ශ්‍රී විෂ්ණු දේවාලය ඇසුරෙන්)

වී.ජී.ආර්. ලක්ෂාරා [1], බී.ජී.සී.එස්. අභිෂේක් [2]

මානව අන්තර් සම්බන්ධතාවයේ නිර්මාණයක් වන සමාජය තුළ මුල් බැසගත් දිගුකාලීන සමාජ සංස්ථාවක් ලෙස ආගම හඳුනාගත හැකිය. ආගම වටා කේන්ද්‍රගත වී ඇති භක්තිය, බහුවිධ වූ පිළිගැනීම් හා මානව කේන්ද්‍රීය අදහස් සමාජය තුළ ගැටුම් නිර්මාණයට හේතු වී ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියට ප්‍රාදේශීය දේවාල පද්ධතියේ මැදිහත්වීම සම්බන්ධයෙන් හඳුනා ගැනීමයි. එමෙන්ම දෙවිනුවර ප්‍රදේශය තුළ ගැටුම් කළමනාකරණයට ප්‍රාදේශීය දේවාල පද්ධතියේ මැදිහත්වීමක් පවතී ද යන පර්යේෂණ ගැටලුව මත පිහිටා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස මාතර දිස්ත්‍රික්කයේ උත්පලවන්නා විෂ්ණු දේවාලය යොදාගත් අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයනයට යොදා ගැනිණි. එහිදී දත්ත රැස්කිරීමේදී අරමුණු සහගත නියැදීම භාවිත කරමින් පුද්ගලයන් දස දෙනෙකු අධ්‍යයනය සඳහා යොදා ගැනිණි. එහිදී සම්මුඛ සාකච්ඡා, ඍජු නිරීක්ෂණ හා සිද්ධි අධ්‍යයනයක් යොදාගත් අතර ලබාගත් දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණයේ අධ්‍යයන අනාවරණයන් ලෙස, අදාළ ප්‍රදේශය තුළ ගැටුම් ඇතිවීම කෙරෙහි මූලිකව දේවාල ක්‍රමය සහ දේවාල උපසංස්කෘතිය හේතු වී ඇත. දේවාල උපසංස්කෘතියේ අංගයක් වන පෙරහැර මංගල්‍යය හා සල්පිල අදාළ ප්‍රදේශය තුළ ගැටුම් නිර්මාණය කෙරෙහි ඍජුව බලපෑම් කර ඇත. එමඟින් අදාළ සමාජයෙහි සමාජ පර්යාය වෙනස් වෙමින් එය විසංවිධානීකරණයට ලක්වී සමාජය තුළ ගැටලු රැසක් උද්ගත වී ඇත. ගැටලු උද්ගතවීම සම්බන්ධ දේවාලයේ මැදිහත්වීම හඳුනා ගැනීමේදී අදාළ අවදානම් කළමනාකරණයට අවශ්‍ය පියවර ගෙන ඇත. එහිදී නීතිරීති පැනවීම, මූල්‍යමය පැහැදිලිතාව, සමාජ තහංචි සහ පරිපාලන ව්‍යුහයේ පවතින ස්වාධීනභාවය කැපී පෙනෙයි. එම පියවර සාධනීය ප්‍රතිඵල ලබා ඇති නමුත් ප්‍රාදේශීය දේවාල පද්ධතිය තම ආගමික ව්‍යුහය ජනප්‍රිය සංස්කෘතිය සමඟ බද්ධ කර ගැනීම තුළ දේවාල පද්ධතියේ සාම්ප්‍රදායික භූමිකාව වෙනස් වී සමාජ ක්‍රමයට බලපෑම් කර ඇති බව හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ පද: උපසංස්කෘතිය, ගැටුම් කළමනාකරණය, දෙවිනුවර උත්පලවන්නා ශ්‍රී විෂ්ණු දේවාලය, මානව කේන්ද්‍රවාදය, සමාජ විසංවිධානීකරණය

[1] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ruvinilakshara2@gmail.com

[2] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. chamodshaminda1234@gmail.com